මගේ අංකය:ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු/2024

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ</u>**
**<u>(ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ)</u>**
**<u>වාර්ෂික ස්ථානමාරු අභියාචනා - 2024</u>**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන හා 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය ප්‍රකාරව **2024.02.01** දින සිට ක්‍රියාත්මක වන පරිදි උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ සේවයේ සහ සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර, සංවර්ධන නිලධාරී) නිලධාරීන් සඳහා ලබාදී ඇති ස්ථානමාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව සලකා බැලීමෙන් පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙයට අමුණා ඇති ඇමුණුම - A (Annexe - A) ලේඛනයේ සඳහන් තීරණයන්ට එළඹ ඇත.

02. මගේ සමාංක හා 2023.12.01 දිනැති වාර්ෂික ස්ථානමාරු නියෝගය මඟින් ස්ථානමාරු ලබාදී නැවත දැනුම්දෙන තෙක් අත්හිටුවා ඇති ස්ථානමාරු සහ මෙම ස්ථානමාරු අභියාචනා නියෝගයේ ඇමුණුම - Aහි සඳහන් පරිදි නිශ්චිත දිනයක් සඳහන් කරමින් අත්හිටුවා ඇති ස්ථානමාරු සම්බන්ධයෙන් අදාළ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය.

03. ඇතැම් නිලධාරීන්ගේ ඉල්ලීම් අනුප්‍රාප්තිකයින් නොමැතිවීම නිසා ඉටු කර නොමැති අවස්ථාවල එම ඉල්ලීම් අනුප්‍රාප්තිකයන් ලද විගස ඉටු කිරීමට සටහන් කරගෙන ඇත. නිලධාරීන්ගේ දුෂ්කරතාවයන් සහ සේවා අවශ්‍යතාවයන් පිළිබඳව විනිශ්චයකාරවරුන් විසින් කරන ලද ඉල්ලීම් ද සලකා බලා ඇතිවන පුරප්පාඩු අනුප්‍රාප්තිකයන් ලද විගස පුරවාලීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

04. ස්ථානමාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදා හැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩ වැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩ වැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

- ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථානමාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් පසුවය.

05. දැනට ප්‍රසූත නිවාඩු ලැබ සිටීම හේතුවෙන් ඉහත 04හි පරිදි කටයුතු කිරීමෙන් පසු නියමිත දින ස්ථානමාරු නියෝග ලද සේවා ස්ථානයේ රාජකාරි බාරගැනීම සඳහා වර්තමාන සේවා ස්ථානයෙන් මුදාහැරීමට නොහැකි වන අවස්ථාවන්හිදී එලෙස මුදාහැරීමට නොහැකි නිලධාරීන් කවුරුන්ද යන්න ස්ථානමාරු ලද සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියාට පිටපතක් සහිතව මා වෙත දැන්වීමට කටයුතු කළ යුතුය.

06. දැනට සේවය කරනු ලබන ස්ථානයේ වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත අදාල ස්ථානමාරු නියෝග කර ඇත්නම් පමණි. දැනට සේවය කරනු ලබන ස්ථානයන්හි වසර හතරක (04) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව ගමන් වියදම් සහ සංයුක්ත දීමනා සඳහා හිමිකම් ලැබේ.

07. තවද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ස්ථානමාරු නියෝග අනුව ස්ථානමාරු නියෝග ලද සියලුම නිලධාරීන්ට (නිශ්චිත දිනයක් සඳහන් කරන ලද ස්ථානමාරු හැර) **2024.02.01** දින නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කිරීමට හැකි වන පරිදි **<u>අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන</u>** වර්තමාන සේවා ස්ථානයෙන් **<u>මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතු බවද</u>** අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2024 ජනවාරි මස 26 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12